ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2008/2009

ගිවිසුම් නීතිය - **LWU 2311**

කාලය - විනාඩි 40

---

දිනය - 2008.10.02 වේලාව - පෙ.ව. 10.00 - පෙ.ව. 10.40 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. පිළිවෙලින් වර්ෂ 1950, 1960 සහ 1970 දී නිෂ්පාදනය කරන ලද බෙන්ස් මෝටර් රථ තුනක හිමිකරුවූයේ පෙරේරා ය. 1970 දී නිෂ්පාදිත බෙන්ස් රථය විකිණීමට පෙරේරාට අවශ්‍ය වුවද, එහි ගැණුම්කරු පුද්ගලිකව මෝටර් රථ එකතුකරන පුද්ගලයෙකු වීමට වගබලා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් විය. එම නිසා 'පුද්ගලික ගැණුම්කරුවකුට පමණක් විකුණනු ලැබේ.' යනුවෙන් ප්‍රවෘත්ති පත්‍ර දැන්වීමෙහි සඳහන් විය. අවාසනාවකට මෙන්, මුද්‍රිත දෝෂයක් හේතුකොටගෙන, විකිණීම් දැන්වීමෙහි සඳහන් වූයේ 1960 දී නිෂ්පාදිත මෝටර් රථයයි. ප්‍රනාන්දු නැමැති මෝටර් රථ වෙළඳාමෙහි නියුතු අයකුට 1950 දී නිෂ්පාදිත රථය මිලදී ගැනීමට අවශ්‍ය විය. එම 1950 දී නිෂ්පාදිත රථය විකිණීමට ඇති බව එම දැන්වීමෙහි සඳහන් ව ඇති බවට ප්‍රනාන්දුට වැරදි සහගත තොරතුරක් සැපයුයේ ඔහුගේ මිත්‍රයෙකු විසිනි.

තමා මෝටර් රථ විකුණුම්කරුවකු හෙයින් පෙරේරා විසින් තමාට මෝටර් රථය නොවිකුණන බව ප්‍රනාන්දු දැන සිටියේය. එම නිසා, ප්‍රනාන්දු විසින් පෙරේරාට දුරකථනයෙන් කතාකොට, තමා ජයරත්න නැමැති මහත්මයෙකු බවත්, ප්‍රවෘත්ති පත්‍ර දැන්වීමෙහි සඳහන් මෝටර් රථය මිලදී ගැනීමට කැමති බවත්, ඒ වෙනුවෙන් රුපියල් මිලියන දෙකක් ගෙවීමට කැමති බවත් දන්වා සිටියේ ය. මීට පිළිතුරු වශයෙන් පෙරේරා පැවසුයේ "ජයරත්න මහත්මයා, මම ඔබට මෝටර් රථය විකිණීමට කැමැත්තෙමි. යන්න ය. පෙරේරා විසින් 1970 දී නිෂ්පාදිත රථය බාරදුන් විට, ගැනුම්කරුගේ අනන්‍යතාවය හෙලිදරව් වූ හෙයින් විකිණීමේ කාර්යය සම්පූර්ණ කිරීම පෙරේරා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එම මෝටර් රථය 1950 දී නිෂ්පාදිත රථය නොවුන ද , ගිවිසුම ක්‍රියාත්මක කිරීමට ප්‍රනාන්දුට අවශ්‍ය විය.

නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

02. විශ්‍රාමික ලොරි රියැදුරෙකු වූ පීරිස්, භාණ්ඩ බෙදාහැරීම සඳහා තමන්ගේම සේවයක් ඇරඹීය. "ගුණරත්න සහ සමාගම" සිල්ලරට භාණ්ඩ විකුණන දිප ව්‍යාප්ත ශාඛා ඇති වෙළඳ සමාගමක් විය. ගමනෙහි දුර ප්‍රමාණය සැළකිල්ලට නොගෙන, යම් නිශ්චිත ප්‍රදේශ සීමාවක් තුළදී ගුණරත්න සහ සමාගමට අයත් ආහාර ද්‍රව්‍ය රැගත් කන්ටේනරයන් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් එක් කන්ටේනරයකට රුපියල් 5000/- ක ප්‍රවාහන ගාස්තුවක් ගෙවීමේ පදනම මත පීරිස්, ගුණරත්න සහ සමාගම සමග ගිවිසුමකට එළැඹිණි, මෙම ගිවිසුම ඔක්තෝබර් 01 වෙනිදා සිට වර්ෂ තුනක කාලයකට බලපැවැත්විණ.

තමන්ට අයත් ලොරි සංඛ්‍යාව වැඩි කර ගැනීම පිණිස බැංකු ණයක් ලබා ගැනීමට, මෙම ගිවිසුම ආධාර කොට ගැනීමට පීරිස් බලාපොරොත්තු වේ. අවාසනාවකට මෙන්, වර්ෂ 1 1/2 ක් ගෙවී ගිය පසු, ප්‍රවාහන ගාස්තු ප්‍රමාණය සම්බන්ධව නැවතත් දෙපාර්ශවය සාකච්ඡා කලයුතු බවට ගුණරත්න සහ සමාගම අදහස් පළකරයි. එක කන්ටේනරයක් ප්‍රවාහනය කිරීමට යන ගාස්තුව රුපියල් 4000/- කට අඩු නොකලහොත්, එම ගිවිසුමෙන් තමන් ඉවත් වන බවට ගුණරත්න සහ සමාගම තර්ජනය කරයි. ගුණරත්න සහ සමාගමෙන් තමන්ට ලැබෙන ව්‍යාපාරික අනුග්‍රහය නොලැබීම තමාට දරාගත නොහැකි පාඩුවක් හෙයින්, එම ඉල්ලීමට පීරිස් එකඟ වේ.

ගිවිසුම බලපැවැත්වූ කාලය ඉකුත් වූ විට, ආර්ථික උත්තර්ජනය (**Economic duress**) යටතේ ගිවිසුමෙහි ගිවිසුමානුකූල වගකීම් වෙනස් කිරීමේ කාර්යය, එවැන්න අවලංගු කලහැකි ක්‍රියාවක් හෙයින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ අඩංගු සෑම කන්ටේනරයක් වෙනුවෙන් ම නොලැබුණ රුපියල් 1000/- ක මුදල නැවත තමාට ලබා ගැනීමට හැකිවේදැයි පීරිස් ඔබගේ උපදෙස් පතයි.

පීරිස්ට උපදෙස් දෙන්න.

- හිමිකම ඇවිරිණි. -